ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2022 (2023)

විෂය අංකය / பாட இலக்கம் : 52

විෂයය / பாடம் : නර්තනය (දේශීය)

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 1 | 21. | 3 |
| 02. | 4 | 12. | 4 | 22. | 5 |
| 03. | 1 | 13. | 2 | 23. | 5 |
| 04. | 1 | 14. | 2 | 24. | 2 |
| 05. | 5 | 15. | 3 | 25. | 3 |
| 06. | 5 | 16. | 5 | | |
| 07. | 3 | 17. | 3 | | |
| 08. | 2 | 18. | 1 | | |
| 09. | 2 | 19. | 1 | | |
| 10. | 5 | 20. | 4 | | |

○ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல்கள் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 25 = 50

## I පත්‍රය

26. චෙන්ඩියර් කුත්තු

27. ශීං ගතර

28. මර්දංග වචර්/වචර්

29. කිරිමලුව

30. තානන

31. සුවිසි විවරණ

32. රටයකුම්/විද්දි යාගය

33. තාත්වික

34. විභාව

35. සඳැස්මක්

| | | |
|---|---|---|
| 36. | i. පොත්කඩේ යක්කම | ii. මුලක් |
| 37. | i. නල දමන්ති | ii. කරදිය |
| 38. | i. ඉකිතාළ | ii. බැලේ |
| 39. | i. මණිපුරි | ii. ක්‍රිෂ්ණ/කෘෂ්ණ |
| 40. | i. සිග්රිඩ | ii. ඔබෙධව |
| 41. | i. කූඩය | ii. කැඩපත |
| 42. | i. නෙළුම් පොකුණ | ii. කොළඹ |
| 43. | i. ජන සංගීතය | ii. පරිගණක සංගීතය |
| 44. | i. මණ්ඩම | ii. හඩ බැය/අඩ බැය/අඩ බැය |
| 45. | i. මැදුම් තානි තිත | ii. සුළු මැදුම් දෙතිත |
| 46. | i. පන්තේරු | ii. මැදුම් තනිතිත |
| 47. | i. ඇලුම් | ii. සිරිපාද |
| 48. | i. A සිංදේනිය | ii. B කන්තිරික්කය |
| 49. | i. භයානක | ii. රෞද්‍ර |
| 50. | i. ජවාව | ii. හෝර්ඩුපත් |

ප්‍රශ්න අංක 01 - 25 දක්වා (02 x 25) ලකුණු 50

ප්‍රශ්න අංක 26 - 50 දක්වා (02 x 25) ලකුණු 50

මුළු ලකුණු 100

## I කොටස

1.

(i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරා ගෙන මහ තනිතිතට අනුව සමගුණ, දෙගුණ සහ සිව්ගුණට ප්‍රස්තාර කරන්න.

(අ) තරිකිට

| / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ත | රි | කි | ට | ත | රි | කි | ට | ත | රි | කි | ට | ත | රි | කි | ට |
| තරි | කිට | තරි | කිට | තරි | කිට | තරි | කිට | තරි | කිට | තරි | කිට | තරි | කිට | තරි | කිට |
| තරිකිට | තරිකිට | තරිකිට | තරිකිට | තරිකිට | තරිකිට | තරිකිට | තරිකිට | තරිකිට | තරිකිට | තරිකිට | තරිකිට | තරිකිට | තරිකිට | තරිකිට | තරිකිට |

(ආ) කිටිතක

| / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කි | ටි | ත | ක | කි | ටි | ත | ක | කි | ටි | ත | ක | කි | ටි | ත | ක |
| කිටි | තක | කිටි | තක | කිටි | තක | කිටි | තක | කිටි | තක | කිටි | තක | කිටි | තක | කිටි | තක |
| කිටිතක | කිටිතක | කිටිතක | කිටිතක | කිටිතක | කිටිතක | කිටිතක | කිටිතක | කිටිතක | කිටිතක | කිටිතක | කිටිතක | කිටිතක | කිටිතක | කිටිතක | කිටිතක |

නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02

බෙර පදය නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 04

මුළු ලකුණු 06

(ii) පහත සඳහන් කවි පදය අවග්‍රහයෙන් ආරම්භ කර මහ තනිතිතට අනුව ප්‍රස්තාර කරන්න.

"නොමදින් විකුම් පාලා සැදෙමින් යුදට ජය ලන්දෙසින් සමිදුන් එ ජනරාලා"

| / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | + | නො | ම | දින් | - | - | වි | කුම් | - | පා | - | ලා | - | - | - |
| + | + | සැ | දෙ | මින් | - | - | යු | ද | ට | ජ | ය | ලන් | - | - | දෙ |
| සින් | - | ස | මි | දුන් | - | - | එ | ජ | න | රා | - | ලා | - | - | - |

නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02

කවි පදය නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 04

මුළු ලකුණු 06

(iii) මුසලඩි වන්නමේ අඩව්ව හෝ නළුගීතිකා තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ නාග ගජගා වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාර කරන්න.

- උඩරට මුසලඩි වන්නමේ අඩව්ව.

| ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 | ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තා | - | කු | තක් | කුං | තරි | කිට | ත | කු | ද | තත් | - | ජෙං | - |
| + | + | + | තත් | - | ජෙං | - | ත | ජෙං | - | තත් | - | ජෙං | - |
| ජී | - | කු | ජික් | කුං | තරි | කිට | ජී | කු | ද | තත් | - | ජෙං | - |
| + | + | + | තත් | - | ජෙං | - | ත | ජෙං | - | තත් | - | ජෙං | - |
| තා | - | කු | තක් | කුං | තරි | කිට | ත | කු | ද | තත් | - | ජෙං | - |
| ජී | - | කු | ජික් | කුං | තරි | කිට | ජී | කු | ද | තත් | - | ජෙං | - |
| තා | - | කු | තක් | කුං | තරි | කිට | ජී | - | කු | ජික් | කුං | තරි | කිට |
| ත | කු | ද | තත් | - | ජෙං | - | + | + | + | තත් | - | ජෙං | - |
| ත | ජෙං | - | තත් | - | ජෙං | - | + | + | + | ජෙං | - | තා | - |
| ජෙං | තා | - | ජෙං | ත | කු | ද | ජෙං | - | ත | තා | | | |

- නළු ගීතිකා තාලය සින්දු වන්නමේ ඉරට්ටිය.

| ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 | ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගත් | - | ත | ග | දි | ග | ත | ග | දි | ත | ගු | ද | ගු | ද |
| තත් | - | ත | දිත් | - | - | - | තත් | දිත් | තත් | කිටි | තක | තරි | කිට |
| තත් | - | - | ජෙං | - | - | - | ත | ක | - | ජෙං | - | - | - |
| ගුදිත් | -ත | ගත | ගති | ගත | ගුදි | ගුද | දොම් | දිත | ගත | ගුදි | තක | දිකු | දක |
| දැහිං | | | | | | | | | | | | | |

- නාග ගජගා වන්නමේ අඩව්ව

| ^ 1 | 2 | 3 | / 1 | 2 | / 1 | 2 | ^ 1 | 2 | 3 | / 1 | 2 | / 1 | 2 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ත | හර් | ද | තත් | - | තත් | - | ත | තත් | - | තත් | - | තත් | - |
| ත | හර් | ද | තත් | - | කි | ට | ත | ක | ට | කු | ද | දොං | - |
| ත | හර් | - | රු | ද | දොං | - | ත | හර් | - | රු | ද | දොං | - |
| ත | හර් | - | රු | ද | දොං | - | දොං | - | ත | ගත් | - | තත් | - |
| ග | තත් | - | කු | ද | ග | ත | තා | - | - | ගත් | - | තත් | - |
| ග | තක් | - | කු | ද | ග | ත | තා | - | - | | | | |

නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02

බෙර පදය නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 06

මුළු ලකුණු 08

6 + 6 + 8 = 20

2. ප්‍රාථමික යුගයේ සිට මානවයාගේ ඇදහිලි-විශ්වාස සහ සමාජ අවශ්‍යතාවන් නර්තනය විධිමත් ලෙස සංවර්ධනය වීමට හේතු වී ඇත.

(i) ආදි මානවයාගේ අභිචාර විධි දෙකක් ඇසුරෙන් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

- ස්වභාවික වස්තූන්ට දේවත්වය ආරෝපණය කොට වන්දනාමාන කිරීම. (ජලය, ගින්න, සුළඟ, ඉර හඳ.......)
- ගෝත්‍රික සමාජයන්හි දක්නට ලැබෙන නර්තන
- දඩයම් අපේක්ෂාවෙන් කරනු ලබන ගෝත්‍රික නර්තන (කොංගෝ ගෝත්‍රික)
- රෝගීන් සුව පත් කිරීමේ අරමුණු කොට ගත් නර්තන (සයිබීරියානු, රතු ඉන්දියානු, මැංචූරියානු......)
- ඕස්ට්‍රේලියානු සහ ඉන්දියානු ගෝත්‍රික ජනයා අතර පවතින ගැහැනු හා පිරිමි දරුවන් වැඩිවියට පත්වීමේ අවස්ථාවලදී සිදු කළ නර්තන
- චාරිත්‍ර පදනම් කරගත් අවමංගල්‍යා පෙරහැර හා බැඳි නර්තන (අප්‍රිකානු සහ ඉන්දියානු ගෝත්‍රික ජනයා සහ ලංකාවේ වැදි ගෝත්‍රික ජනයා අතර පවතින චාරිත්‍ර)

අභිචාර විධි දෙකක් නම් කිරීමට ලකුණු 02

ඒ ඇසුරෙන් පැහැදිලි කිරීමට ලකුණු 04

මුළු ලකුණු 06

(ii) මහනුවර යුගයේ ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ස්වභාවය, විදේශිකයින්ගේ වාර්තා දෙකක් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

- ස්පිල් බර්ජන්ගේ වාර්තාව - මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ.................. "විදේශීන් දුටු පුරාණ ලංකාව"
- රොබට් නොක්ස්ගේ වාර්තාව - විහාර දේවාලවල තේවාව සඳහා.................. "එදා හෙළදිව"

වාර්තා දෙක ඇසුරෙන් සාකච්ඡා කිරීමට (3×2) ලකුණු 06

(iii) ක්‍රි.ව.1950-1970 කාල පරිච්ඡේදයේදී නර්තන කලාවේ ප්‍රගමනය පිළිබඳව සාධක හතරක් ඇසුරෙන් පහදන්න.

- 1952 - රජයේ ලලිත කලායතනයේ චිත්‍ර අංශය බිහිවීම.
- 1953 - රජයේ ලලිත කලායතනයේ නර්තන හා සංගීත අංශ බිහිවීම.
- 1956 - සංස්කෘතික දෙපාර්තමේන්තුව ආරම්භ වීම හා කලායතන ආරම්භ වීම.
- 1960 - යුනෙස්කෝ පාඨශාලීය නැටුම් තරගය පැවැත්වීම
- 1965 - පේරාදෙණිය නැටුම් හා සංගීත විභාගය ආරම්භ වීම
- 1967 - ජාත්‍යන්තර වෙළඳ සැණකෙළිය සඳහා නර්තන කණ්ඩායම් විදේශ ගතවීම

- 1972 - රජයේ පාසල්වල සෞන්දර්ය විෂය අනිවාර්ය විෂයක් බවට පත්වීම.
- 1972 - හිරාගම සෞන්දර්ය ගුරුවිදුහල ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ආරම්භ වීම.
- 1974 - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට සෞන්දර්ය අධ්‍යයන ආයතනය අනුබද්ධ කිරීම.
- 1975 - ජා.පො.අ.සහතික පත්‍ර විභාගය ආරම්භ වීම.
- 1976 - අ.පො.ස උසස් පෙළ විෂය ධාරාවට නර්තනය විෂයක් වශයෙන් ඇතුළත් කිරීම.
- 1977 - ජාතික නැටුම්/ සංගීත විභාගය ආරම්භ වීම.
- 1978 - ප්‍රථමවරට ලලිත කලා උපාධිධාරීන් බිහිවීම.
- 1979 - H.N.C.E. විභාගයට සිසුන් පෙනී සිටීම.
- 70 දශකයේ - ත්‍රිවිධ හමුදා/පොලිස්...................... ආදි නර්තන කණ්ඩායම් බිහිවීම.

සාධක හතරක් නම් කිරීමට ලකුණු 04

ඒ ඇසුරෙන් පැහැදිලි කිරීමට ලකුණු 04

මුළු ලකුණු 08

6 + 6 + 8 = 20

3. ඇදහිලි-විශ්වාස මත පදනම් වූ ශාන්තිකර්ම මගින් තත්කාලීන සමාජ සංස්කෘතික පසුබිම පිළිබිඹු වේ.

(i.) වලියක් මංගලාය ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු පැහැදිලි කරන්න.

- දිය කපා පෙරහැර අවසන් වීමෙන් පසු දෙවියන්ට පිං දීම.
- ඇසල පෙරහැර මූලික කරගෙන විෂ්ණු දේවාලය තෝරා ගැනීම.
- ඇසල පෙරහැර පැවැත්වීම සඳහා මූලිකත්වය දැරූ, ඊට සහභාගී වූ සියළු දෙනාට සෙත් පැතීම.
- රාජ්‍ය පාලන තන්ත්‍රයේ සහභාගීත්වය (අතීත වර්තමාන තත්ත්වයන්)
- රාජ්‍ය පාලකයාගේ දෝෂ දුරු කිරීම සඳහා සෙත් පැතීමේ අභිලාෂය.

අරමුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කර ඇත්නම් ලකුණු 06

(ii.) කිරිමඩුව ශාන්තිකර්මයේ කිරි ඉතිරීම සහ තුගේහැල්ල වෙනුවෙන් ඉදිකෙරෙන සැරසිලි දෙක විස්තර කරන්න.

**කිරි මැස්ස**

- කිරි උතුරුවා සෙත් ශාන්ති කොට සෞභාග්‍ය ළඟා කර දීම .
- මිනිස් කරවට ප්‍රමාණයට උස් වූ මැස්ස පේකඩ සහිතව කෙසෙල් බඩ ගොප්කොළ ආදියෙන් සකස් කර ගන්නා බව.
- සතර අතට විහිදෙන ආරුක්කු හතර ගොප් සැරසිලිවලින් සකස්කර ගන්නා බව.
- මැස්සෙහි කණු සඳහා කදුරු හා මුලු හතරෙහි තුග අතු එල්ලනු ලබන බව.

නුග අත්ත

- ශක්තිමත් නුග අත්තක් රඟමඩලේ පසෙක සිටුවාගන්නා බව.
- ගොප් කොළ ආධාරයෙන් පැණි සහිත මුට්ටියක් සැරසිල්ලක් ලෙස එල්ලා ඇති බව
- නුගේ කැපීම අවස්ථාව නිරූපණය කිරීම සඳහා කෙසෙල්බඩවලින් සකස් කර ගත් පොරවක් ආධාර කරගන්නා බව

සැරසිලි දෙක නම් කිරීමට ලකුණු 02

විස්තර කර ඇත්නම් ලකුණු 04

මුළු ලකුණු 06

(iii.) රටයකුම ශාන්තිකර්මය උපදේශන ක්‍රියාවලියකි. නානුමුරය හා දරුනැළවිල්ල ඇසුරෙන් සාකච්ඡා කරන්න.

නානුමුරය

- දොළහ පෙළපාලිය අන්තර්ගත පෙළපාළි අංගයන්හි විවිධ අවස්ථා පිළිවෙළින් පැහැදිලි කර තිබීම. (නා පිරිසිදු වීම, සළු පිළි පැළඳීම....)
- ඇදුරා රිද්දි බිසවුන්සේ සමාරෝපය වෙමින් නානුමුරයේ අවස්ථා අනුකරණාත්මකව රඟමඩලෙහි ප්‍රදර්ශනය කිරීම.
- කාන්තාවකගේ භාවාත්මක හැඟීම් උද්දීපනය කරන අයුරින් නාරිලාලිත්‍යයෙන් නර්තන ඉදිරිපත් කිරීම (හිස පීරීම, නානු ගෑම........)

දරු නැළවිල්ල

- කාන්තා වෙස් ගත් ඇදුරා මව් සෙනෙහස ජනනය වන පරිදි කවි කියමින් දරුවා නැළවීම, සුරතල් කිරීම, නැහැවීම, කිරිදීම.... වැනි දරු සෙනෙහසේ භාවමය ලක්ෂණ නාට්‍යානුසාරයෙන් රඟදක්වන බව.
- දරුඵල අපේක්ෂාවෙන් සිටින කාන්තාවන් හට උපදේශන ක්‍රියාවලියක් සිදුවන බව.
- නානුමුරය හා දරු නැළවිල්ල සඳහා කාන්තාවන්ගේ ලාලිත්‍යය, සුකුමල බව ගායනා, බෙරපද රංගන හා සංවාද මගින් තීව්‍ර වන බව.

කරුණු දෙක බැගින් ගෙන සාකච්ඡා කර ඇත්නම් (4×2) ලකුණු 08

6 + 6 + 8 = 20

4. රෝග නිවාරණයට බලපාන මනෝ විද්‍යාත්මක ප්‍රතිකාර, ක්‍රමවේද ලෙස ශාන්තිකර්මයන්හි ගායන, වාදන සහ පසුබිම් අලංකරණ යොදා ගෙන තිබේ.

(i.) බලි ශාන්තිකර්මයේ ග්‍රහයන් තිදෙනෙකුට හිමි වර්ණ නම් කර එම වර්ණ සකස් කර ගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

- ඉරුට - රත් පැහැය, සඳුට - ලා දම්, සිකුරු - සුදු
  බුධ - සුදු, අඟහරු - නිල්, ගුරු - රන්වන්,
  රාහු - සුදු, කේතු - රන්වන්, සෙනසුරු - නිල්
- ගුරුගල් ,පොල්කටු අඟුරු ,මකුළු මැටි, කොළ හා පොතු අමුද්‍රව්‍ය ලෙස භාවිතයට ගැනීම
- වර්ණ සකස්කර ගන්නා ආකාරය පැහැදිලි කිරීම

ග්‍රහයින් නම් කිරීම හා වර්ණ නම් කිරීමට ලකුණු 03

වර්ණ ගන්වන ආකාරය පැහැදිලි කිරීමට ලකුණු 03

මුළු ලකුණු 06

(ii.) සන්නියකුමේ රංගනය තීව්‍ර කිරීම සඳහා බෙරවාදකයාගේ දායකත්වය විස්තර කරන්න.

- නර්තන ශිල්පියාගේ විවිධ අංග චලනයන්හි ජීවය බෙර පද වාදනයෙන් සිදුවන බව.(සන්නි,පාළි,යක්ෂ චරිත සහා ගත වීම)
- බෙර පද පිරීම, බෙර පද පෙන්වා වාදනය ආදී වාදකයාගේ දක්ෂතාව නර්තන ශිල්පියාට පිටුබලයක් වන බව.
- භාවාත්මක ස්වභාවය හා චලනවල ධ්වනිගුණ මතුවන පරිදි බෙර පද වාදනය කිරීම.

කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කර ඇත්නම් ලකුණු 06

(iii.) කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව යන ශාන්ති කර්ම අතුරෙන් එකක් තෝරා ගෙන ඒ ආශ්‍රිත සැරසිලි විශේෂතා හතරක් විමසුමට ලක් කරන්න.

<u>කොහොඹායක් කංකාරිය</u>

- අයිලය
- යහන
- මුවය සහිත කෙසෙල් ගස
- මඩු සැරසිලි

<u>දෙවොල් මඩුව</u>

- පත්තිනි තොරණ
- දෙවොල් තොරණ
- දෙවොල් ගෙය
- කාලපන්දම් ගස
- මඩුව
- මල් යහන්

<u>පහන් මඩුව</u>

- පත්තිනි තොරණ
- දෙවොල් තොරණ
- පත්තිරිප්පුව
- කාලපන්දම් ගස
- මල් යහන්

සැරසිලි හතරක් තෝරා ගැනීමට ලකුණු 04

ඒ පිළිබඳ විමසුමක් කර ඇත්නම් ලකුණු 04

මුළු ලකුණු 08

6 + 6 + 8 = 20

5.

(i.) ලීකෙළි සහ කෝලාට්ටම්, කුලු සහ සුලකු , කළගෙඩි සහ වෙම්බු යන සිංහල සහ ද්‍රවිඩ ගැමි නැටුම්වල වෙනස්කම් දැකිය හැකිය.

- ගායනවල
- රංගවස්ත්‍රාභරණ
- සංගීතය
- වාදන භාණ්ඩ
- චලන
- උපකරණ
- අරමුණු

වෙනස්කම් තුනක් ඇසුරෙන් විස්තර කර ඇත්නම් ලකුණු 06

(ii.) පොත්කඩේ යක්කමෙහි නිරූපිත සමාජ සාරධර්ම තුනක් පැහැදිලි කරන්න.

- සුදු රෙදිකඩ මත කැබූ බුලත් හුරුල්ලක් දී පහන් මඩුවට ආරාධනා කරමින් පිළිගැනීම සිදු කෙරෙන බව.
- විවාහ ක්‍රමයන් නිසා ඉන් ඇතිවන්නා වූ ප්‍රතිඵලයන්ගෙන් දෙබස් මඟින් ද්විත්ව අර්ථකථන මතුවන බව.
- දෙබස් හා සංවාද මගින් සමගිය, සාමූහිකත්වය වැනි සාරධර්ම ගොඩනැගෙන ආකාරය පෙන්නුම් කෙරෙන බව.

සාරධර්ම තුනක් නම් කිරීමට ලකුණු 03

පැහැදිලි කිරීමට ලකුණු 03

මුළු ලකුණු 06

(iii.) පහත දැක්වෙන කරුණු ඇසුරෙන් පීරියක් සහ ජස චරිතවල වෙනස්කම් සංසන්දනාත්මකව විග්‍රහ කරන්න.

(අ) ගායන, වාදන, නර්තන

- යක් සහ කෝලම් චරිත ලක්ෂණ ඉස්මතු කිරීම සඳහා ගායන, වාදන, නර්තන යොදා ගන්නා බව

(ආ) රංගවස්ත්‍රාභරණ

- ඇඳුම් පැලඳුම්වල වෙනස්කම් හඳුනාගෙන ඇත්නම් (වර්ණ, වෙස්මුහුණු)

ගායන, වාදන ,නර්තන ඇසුරෙන් විග්‍රහ කර ඇත්නම් ලකුණු 04

රංගවස්ත්‍රාභරණ ඇසුරෙන් විග්‍රහ කර ඇත්නම් ලකුණු 04

මුළු ලකුණු 08

6 + 6 + 8 = 20

6. පහත සඳහන් වගුවේ (අ) (ආ) සහ(ඉ) යන කොටස් ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ).කොටස - කථක් නර්තන සම්ප්‍රදායට අයත් නර්තනාංගය තෝරාගෙන විස්තර කරන්න.

ආමද්

- නමස්කාර ආදියෙන් පසුව ඉදිරිපත් කරන ප්‍රථම නර්තන අංගය බව.
- නර්තකයා රඟමඬලට හෙවත් නර්තන මණ්ඩපයට පැමිණීම හෙවත් අවතීර්ණ වන බව.
- මුස්ලිම් රජවරුන්ගේ අනුග්‍රහය මත කතක් නර්තනයට එක්වූවක් බව.
- විලම්භ ලය (විලම්බිත්) අනුව වැයෙන තාල සහ සංගීතයට ලාලිත්‍යමය චලන එක්වී ඇති බව.

නර්තනාංගය තෝරා ගැනීමට ලකුණු 02

විස්තර කිරීමට ලකුණු 04

මුළු ලකුණු 06

(ආ). කොටස - දේශීය මුද්‍රා නාට්‍ය කෘතිය තෝරාගෙන එහි රංග රචනය විමසන්න.

පටාචාරා

- දේශීය නර්තනයට අමතරව භාරතීය හා බටහිර නර්තන ශෛලීන් සංයෝජනය කර තිබෙන බව.
- දේශීය ගැමි නර්තන යොදා ගෙන ඇති බව.
- දේශීය තාල හා නාද රටා යොදාගෙන ඇති බව
- පෙරඅපර දෙදිග සංගීත ඛණ්ඩ මැනවින් යොදා ගෙන ඇති බව.

කලා කෘතිය තෝරා ගැනීමට ලකුණු 02

එහි රංග රචනය විමසා තිබේ නම් ලකුණු 04

මුළු ලකුණු 06

(ඉ). කොටස - හංසවිල බැලේ නාට්‍යයේ සංගීත ශිල්පියා හඳුනාගෙන ඔහුගේ නිර්මාණ ඇගයීමකට ලක් කර කරන්න.

පියටර් චෙයිකොව්ස්කි

- නට් ක්‍රැකර්, නිදි කුමාරිය සහ හංසවිල යන බැලේ නාට්‍ය නිර්මාණය ඇසුරෙන් විස්තර කර තිබේ නම්

සංගීත ශිල්පියා හඳුනා ගැනීමට ලකුණු 02

ඇගයීමට ලක් කර ඇත්නම් 06

මුළු ලකුණු 08

$6 + 6 + 8 = 20$

7. ශ්‍රී ලාංකේය නර්තනාංග ප්‍රාසංගිකව ඉදිරිපත් කිරීමේදී දේශීය අනන්‍යතා ලක්ෂණ ආරක්ෂා කර ගැනීම වැදගත් වේ.

(i.) බැරිසිල් කලා කෘතියේ චරිත නිරූපණයේ දැකිය හැකි උපහාසාත්මක ලක්ෂණ පැහැදිලි කරන්න.

- සිල් සමාදන් වූ උපාසිකාවන් අතින් සිදුවන ක්‍රියාකාරකම්වල දක්නට ලැබෙන අඩුපාඩු උපහාසාත්මකව විචාරය කිරීම.
  උදා:- ඇනුම් ඇරීම, හිරි ඇරීම, මදුරුවන් තැලීම, ඕපාදූප කීම.........ආදි
- සමාජ යථාර්ථ ස්වභාවයන් මතුකර දක්වන බව

උදාහරණ සහිතව පැහැදිලි කර ඇත්නම් ලකුණු 06

මුළු ලකුණු 06

(ii.) නර්තන කලාවේ නූතන ප්‍රවණතා සාම්ප්‍රදායික නර්තනය කෙරෙහි බලපාන ආකාරය නර්තන රචනය සහ රංගවස්ත්‍රාභරණ ඇසුරෙන් සාකච්ඡා කරන්න.

- නර්තන රචනය
  - බටහිර නර්තන ආකෘතීන්හි ආභාසය ලබා ඇති බව.
  - සම්ප්‍රදායික නර්තන අංගයන්හි අනන්‍ය ලක්ෂණ මිශ්‍රිත අංගහාර ලෙස යොදා ගන්නා බව.
  - විවිධ සංගීත ඛණ්ඩ හා ගීත නිර්මාණාත්මකව යොදා ගන්නා බව
  - රංග් රචනාවන්හි ඇති ප්‍රාසංගික බව.
  - නූතන තාක්ෂණික මෙවලම් භාවිතයෙන් නව ක්‍රමවේදයන්ට අනුගත වන බව

රංගවස්ත්‍රාභරණ

- සාම්ප්‍රදායික නර්තනයට ගැලපෙන, නොගැලපෙන රංගවස්ත්‍රාභරණ නිර්මාණකරණයේදී දැකිය හැකි බව.
- ප්‍රාසංගික බව ඔතුකර ගැනීම සඳහා විවිධ අබ්‍යුද්‍රව්‍ය භාවිත කරන බව.(වීදුරු කැබලි,පබළු)
- භාරතීය හා බටහිර රටවල හිස් පලඳනා හා අනුකරණාත්මක රංග වස්ත්‍ර නර්තනය සඳහා භාවිත කර ඇති බව.
- තාක්ෂණික විධි ක්‍රම භාවිතයෙන් රඟමඩල වර්ණ ගැන්වීමේදී ආලෝකකරණය නිසා රංගවස්ත්‍රාභරණවල වෙනස්කම් ඇතිවන බව

නර්තන රචනය හා රංගවස්ත්‍රාභරණ යටතේ කරුණු දෙක බැගින් ගෙන සාකච්ඡා කර තිබේනම්

3 3

ලකුණු (3×2) 6

(iii.) රියැලිටි තරග පැවැත්වීම මගින් දේශීය නර්තනයට සිදුවිය හැකි අයහපත වළක්වා ගැනීම සඳහා උචිත යෝජනා හතරක් සාකච්ඡා කරන්න.

- බටහිර හා භාරතීය වලින දේශීය නර්තනයට හානියක් නොවන පරිදි යොදා ගතයුතු බව.
- දේශීය වාද්‍ය භාණ්ඩවල අනන්‍යතාවය හඳුනා ගනිමින් පෙර අපරදිග සංගීත බණ්ඩ භාවිත කළ යුතු බව.
- දේශීය අනන්‍යතාව රැකෙන පරිදි ගායන, වාදන නිර්මාණකරණයේ යෙදිය යුතු බව.
- දේශීය සංස්කෘතිය හා බැඳි රංග වස්ත්‍ර භාවිත කළ යුතු බව.
- රූපවාහිනියට උචිත පරිදි පසුතල නිර්මාණ හා ආලෝකකරණ ශිල්ප ක්‍රම යොදා ගත යුතු බව.

යෝජනා හතරක් ඇසුරෙන් සාකච්ඡා කර ඇත්නම් ලකුණු 08

2 × 4

මුළු ලකුණු 08

6 + 6 + 8 = 20

8. නූතන තාක්ෂණික මෙවලම් භාවිතය නිසා නර්තන කලාව ජනප්‍රියත්වයට පත්ව තිබේ.

(i.) අංගරචනය හා රංග වස්ත්‍රාභරණ නිර්මාණ ඇසුරෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

අංගරචනය

- නවීන තාක්ෂණික ක්‍රම වේද අනුව සැකසුණු ද්‍රව්‍ය අංගරචනා සඳහා භාවිත වන බව.
- නවීන අංගරචන උපකරණ නම් කිරීම.
- අන්තර්ජාලය මගින් නූතන අංගරචන ක්‍රමවේද හඳුනාගෙන නවතාවකින් ඉදිරිපත් කරන බව
- විධිමත් අංගරචනයන් ප්‍රේක්ෂකයා හා නර්තන ශිල්පියා අතර සහසම්බන්ධතාව ගොඩ නගන බව
- තාක්ෂණික මෙවලම් භාවිතය නිසා චරිත නිරූපනයට යෝග්‍ය පසුබිම සකසන බව.

රංගවස්ත්‍රාභරණ

- වේදිකා ආලෝකකරණයට සරිලන පරිදි නූතන අමු ද්‍රව්‍ය භාවිතයෙන් රංගවස්ත්‍ර නිර්මාණය කර ඇති බව. උදා:- (වීදුරු,කැබලි,පබළු)
- ඇඳුම්වල උචිත වර්ණ භාවිතයෙන් විචිත්‍රත්වය ගොඩනගා ඇති බව.
- මටාපිට හා භාරතීය ආභාසය ආභරණ සඳහා යොදා ගන්නා බව.
- නූතන ක්‍රමවේද අනුගමනය කරමින් හිස්පලඳනා භාවිතයට ගෙන ඇති බව.

අංගරචනයේ කරුණු දෙකක් ඇසුරෙන් සාකච්ඡා කර ඇත්නම් ලකුණු 03
රංගවස්ත්‍රාභරණ කරුණු දෙකක් ඇසුරෙන් සාකච්ඡා කර ඇත්නම් ලකුණු 03
මුළු ලකුණු 06

(ii.) රංගාලෝකකරණය හා ශබ්ද පරිපාලනය ඇසුරෙන් ඉහත ප්‍රකාශය විමසුමට ලක් කරන්න.

රංගාලෝකකරණය

- රංගාලෝකකරණයෙන් නර්තනය විචිත්‍රත්වයට පත්විඇති බව.
- මනෝ භාවයන් නිවුවන පරිදි ආලෝකකරණය භාවිත කර ඇති බව.
- නූතන ආලෝක ශිල්ප ක්‍රම භාවිත කරන බව.
- අංග,ප්‍රත්‍යංග හා උපාංග මතුකර දැක්වීමට ආලෝකකරණය වැදගත් මෙහෙයක් ඉටු කරණ බව.
- ශෛලීන්ට උචිත පරිදි පසුතල නිර්මාණ දර්ශන මැවීමට හැකි බව.
- ආලෝක තීව්‍රතා පාලකය මගින් නිර්මාණයට අවැසි පරිදි ආලෝකය පාලනය කර ගත හැකි බව.

ශබ්ද පරිපාලනය

- අද්‍යතනයේ ශබ්ද පරිපාලනය තාක්ෂණික මෙවලම් භාවිතය මගින් සිදු කරන බව.
  MIXER (මුසුකරණය) MIC,EQUALIZER (හඬසමකරණය) POWER
  AMPLIFIER, SPEAKER (ශබ්ද විකාශනය)
- පරිගණක සංගීතය තාක්ෂණය මගින් නර්තන නිර්මාණ පුහුණුවට හා ප්‍රසාංගිකරණයට පහසුව සලසන බව.
- භාවාත්මක බව තීව්‍ර කිරීම සඳහා මිශ්‍ර සංගීත ඛණ්ඩ, විවිධ තූර්ය නාද සමෝධානය කිරීම තාක්ෂණික මෙවලම් මගින් සිදු කළ හැකි බව.
- ප්‍රේක්ෂකයාට මනා රස වින්දනයක් හා සාර්ථක නිර්මාණයක් ඉදිරිපත් කළ හැකි බව.

රංගාලෝකකරණය කරුණු දෙකක් ඇසුරෙන් සාකච්ඡා කර ඇත්නම් ලකුණු 03
ශබ්ද පරිපාලනය කරුණු දෙකක් ඇසුරෙන් සාකච්ඡා කර ඇත්නම් ලකුණු 03
මුළු ලකුණු 06

(iii.) සාම්ප්‍රදායික රඟමඩලේ නර්තනාංග සහ ප්‍රාසංගික වේදිකාවේ නිර්මාණ සංසන්දනය කරමින් ඉහත ප්‍රකාශය විචාරයට ලක් කරන්න.

- සාම්ප්‍රදායික රඟමඩල හා නූතන වේදිකා නම් කර ඇත්නම්
- එළිමහන් වේදිකා හා ගෘහස්ථ වේදිකා අතර ඇති වෙනස අධ්‍යයනය කර තිබේ නම්,
- පහත සඳහන් කරුණු ඔස්සේ ඉහත ප්‍රකාශය "සාම්ප්‍රදායික රඟමඩලේ/ ප්‍රාසංගික වේදිකාවේ නිර්මාණ" සංසන්දනය කර
    - ➢ ආලෝකකරණය
    - ➢ රංගවස්ත්‍රාභරණ
    - ➢ අංගහාර
    - ➢ අංගරචනය
    - ➢ පසුතල නිර්මාණ
    - ➢ සැරසිලි

කරුණු හතරක් සංසන්දනය කර ඇත්නම් ලකුණු (4×2) 08

මුළු ලකුණු 08